## <u>සංශෝධන - 02</u>

## <u>නැගෙනහිර පළාත් සභාව</u>
## <u>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

## <u>නැගෙනහිර පළාතේ පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017</u>

ඉහත සඳහන් බඳවා ගැනීම සම්බන්ධව 2017 ජූලි මස 31 වැනි සඳුදා ''දිනමිණ'' පුවත්පතේ 41 වැනි පිටුවෙහි සහ ''තිනකරන්'' පුවත්පතේ 34 වැනි පිටුවෙහි පළ කරන ලද දැන්වීම් අනුව, නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ සවිස්තරව පළ කරන ලද විභාග දැන්වීමෙහි පහත සඳහන් කොටස් සංශෝධනය කරනු ලැබේ.

**01. යෝග්‍යතා ඃ-**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

iii. **2017.08.21** වන දිනට වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **45** ට නොවැඩි විය යුතුය.

**02. බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි ඃ-**

2.1 රැකියා විරහිත හෝ බඳවා ගැනීම සඳහා අවම සුදුසුකමක් වශයෙන් උපාධියක් ලබා තිබීම අවශ්‍ය වන තනතුරක සේවය කරන නිලධාරීන් හැර සෙසු තනතුරු දරණ උපාධිධාරීන්හට අයදුම්පත් යොමු කළ හැකිය.

රැකියා විරහිත උපාධිධාරීන් තමන් රැකියා විරහිත උපාධිධාරියෙකු බවට දිවුරුම් ප්‍රකාශයක්/ප්‍රතිඥාවක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු අතර, ඔහු ස්ථිරව පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ප්‍රාදේශීය ලේකම් විසින්ද ඒ බව සහතික කර තිබිය යුතුය. බඳවා ගැනීම සඳහා අවම සුදුසුකමක් වශයෙන් උපාධියක් ලබා තිබීම අවශ්‍ය වන තනතුරක සේවය නොකරන උපාධියක් සහිත නිලධාරීන් විසින් දැනට ලබන වැටුපට අදාළ වැටුප් කේත අංකය සඳහන් කළ සේවා සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

දැනට ශ්‍රී ලංකා ගුරු සේවයේ නියුතුවූවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ. එවැනි අය අයදුම්පත් යොමු කිරීම වරදක් සේ සලකනු ලැබේ.

**03. අයදුම්කිරීමේ ක්‍රමය ඃ**

3.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ **දෙපැත්තම පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 5.3 සිට 11.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

3.5 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් අයදුම්කරන්නේ නම්, අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සමඟ එවිය යුතුය.

**06. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ

විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර යොමු කළ පසු ඔහු/ඇය දැනටමත් බඳවා ගැනීම සඳහා අවම සුදුසුකමක් වශයෙන් උපාධියක් ලබා තිබීම අවශ්‍ය වන තනතුරක සේවය කරන රාජ්‍ය සේවයේ නියුතු අයෙකු බවට හෙළිවුවහොත් ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද දැනුම් දෙමි.

නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීමෙහි සඳහන් අනෙකුත් කොන්දේසි එලෙසින්ම බලපැවැත්වෙන අතර, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයෙහි වෙනසක් සිදු නොවන බවද දන්වා සිටිනු ලැබේ.

ඒ අනුව ඉහත සඳහන් සංශෝධන සැලකිල්ලට ගෙන අයදුම්පත්‍ර යොමු කරන ලෙස සියළුම අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින අතර, මීට පෙර අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවන බවද දන්වා සිටිමි.

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

**EX/Rec/17/18**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාතේ පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ**
**3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017**

**විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය**
සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)*

**විභාගයට ඉදිරිපත් වන නගරයේ අංකය**
*(10 වැනි ඡේදයේ සඳහන් නගර අංකය ලියන්න.)*

**ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :** ..........................................................................................

ඉල්ලුම් කරනු ලබන විෂයය **:** (උපලේඛන 01 අනුව යොදන්න)

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |

**1.0** 1.1 මුලකුරු සමග නම : Rev/Mr/Mrs/Miss ..........................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................................

1.3 සම්පූර්ණ නම : ..........................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..........................................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ..........................................................

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ..........................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................................

2.2 ස්ථිර ලිපිනය : ..........................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..........................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..........................................................

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 **2017.08.21** දිනට වයස : වර්ෂ මාස දින

**4.0** ජනවර්ගය : සිංහල ශ්‍රී ලාංකික දෙමළ මුස්ලිම් වෙනත්
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

**5.0** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ..............................................
(ii) විභාග අංකය : ..............................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ..............................................
(ii) විභාග අංකය : ..............................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

5.3 උපාධිය පිළිබඳ විස්තර

5.3.1 උපාධිය : ....................................................................................................

5.3.2 විශ්ව විද්‍යාලය/ ආයතනයේ නම: ......................................................................

5.3.3 උපාධිය වලංගු වන දිනය: .......................................................................................

5.3.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන්: .........................................................

5.4 ඩිප්ලෝමාව පිළිබඳ විස්තර

5.4.1 ඩිප්ලෝමාව : ....................................................................................................

5.4.2 ආයතනයේ නම: .......................................................................................................

5.4.3 ඩිප්ලෝමාව වලංගු වන දිනය: .........................................................................

**6.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

6.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : ………………….………………………………………….

6.2 වර්තමාන තනතුර : ………………….………………………………………….

6.3 මුල්පත්වීම් දිනය : ………………….………………………………………….

6.4 වර්තමාන තනතුරෙහි ස්ථිර කළ දිනය: ………………….………………………………………….

**7.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ………………….……………………………….………………..

**8.0** විභාග ගාස්තු ගෙවූ (පැහැදිලි විස්තර සහිත) ලදුපත අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

**9.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම තනතුර සඳහා අයදුම්කරනු ලබන මා රැකියා විරහිත/බඳවා ගැනීම සඳහා අවම සුදුසුකමක් වශයෙන් උපාධියක් ලබා තිබීම අවශ්‍ය වන තනතුරක සේවය නොකරන උපාධියක් සහිත නිලධාරියෙකු බව සහතික කරන අතර, ඉල්ලුම්පත්‍රය මා විසින් ඉදිරිපත් කළ පසු දැනටමත් උපාධියක් ලබා තිබීම අවශ්‍ය වන තනතුරක සේවය කරන අයෙකු බවට හෙළිවුවහොත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය විසින් ගනු ලැබිය හැකි ඕනෑම තීරණයකට එකඟ වන බව ප්‍රකාශ කරමි.

(ආ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඈ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : …………………….. ………………….………………

අයදුම්කරුගේ අත්සන

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 3.5 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන …………………………………….……………………….... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී …………....………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

දිනය : ………………………….. …………………………..…………………….

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම: ........................................................................

තනතුර : ...........................................................................................

ලිපිනය : ...........................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(රජයේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියෙකු වශයෙන් ……………………………… තනතුරෙහි සේවය කරන …………………………………………… මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය තම සේවා කාලය තුළ කිසිදු විනයානුකූල කටයුත්තකට භාජනය නොවූ බවත්, සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මෙහි ඔහු/ඇය විසින් සඳහන් කර ඇති විස්තර ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

දිනය : ………………………….. ……………………..…………………..

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ...........................................................................................

පදවි නාමය : ...........................................................................................

ලිපිනය : ...........................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)